සීමාසහිත මීගමුව විවිධ සේවා සමුපකාර සමිතිය

තනතුරු ඇබෑර්තු

සීමාසහිත මීගමුව විවිධ සේවා සමුපකාර සමිතියේ පුරප්පාඩු වී ඇති පහත තනතුරු සඳහා ගම්පහ දිස්ත්‍රික්කය තුළින් සුදුසුකම්ලත් අයගෙන් සමිති අභ්‍යන්තරයෙන් හා බාහිරෙන් 2023/03/31 දින සිට 2023/04/14 දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ. අභ්‍යන්තර සේවකයින්ට ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.

තනතුර	වැටුප් පරිමාණ අංකය	පුරප්පාඩු සංඛ්‍යාව	වයස අවුරුදු	මාසික වැටුප් පරිමාණය
ජ්‍යෙෂ්ඨ නිලධාරී	103:7 III	02	23 - 45	16994 - 220x10-260x10 -320x10 - 380x5=26894/-
කළමනාකරණ සහකාර	104:9 III	06	18-45	14974-145x10-180x10-220x10-260x10=23024/-
පිළිගැනීමේ නිලධාරී	104:9 III	01	18-45	14974-145x10-180x10-220x10-260x10=23024/-
ඖෂධ සංයෝජක	104:9 III	01	21-45	14974-145x10-180x10-220x10-260x10=23024/-
කළමනාකරු - ප්‍රාදේශීය	104:8 III	07	21-45	15724 - 180x10 - 220x10 - 260x10 - 320x10=25524/-
වෙළඳ සහකාර	105:10 III	08	18-45	14504-130x10-145x10-180x10-220x10=21254/-
රියදුරු	105:10 III	01	18-45	14504-130x10-145x10-180x10-220x10=21254/-
රිය සහායක	105:11 III	01	18-35	14234-120x10-130x10-145x10-180x10=19984/-
කම්කරු	105:11 III	01	18-45	14234-120x10-130x10-145x10-180x10 =19984/-
ඉන්ධන පුරවන්නා	105:11 III	02	18-45	14234-120x10-130x10-145x10-180x10 = 19984/-

02. මෙම තනතුරු ස්ථිරය, සමුපකාර විශ්‍රාම වැටුප් අරමුදලට දායකත්වය හිමිය.

03. බඳවා ගැනීමේ සුදුසුකම්

ජ්‍යෙෂ්ඨ නිලධාරී	අ) 104 - 8 වැටුප් පරිමාණයේ තනතුරට අදාළ ස්ථිර තනතුරක වසර දෙකක සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම. (යතුරු කළ පැදවීමේ වලංගු බලපත්‍රයක් ලබා තිබීම අමතර සුදුසුකමක් වේ) හෝ
	ආ) අ.පො.ස. (සා.පෙ) විභාගයෙන් ගණිතය හා සිංහල භාෂාව ඇතුළුව විෂයන් හතරකට සම්මාන සහිතව සමත් වීම හෝ සමුපකාර (සා.පෙළ) විභාගය සමත් වීම හෝ සහ පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ වසර දෙකකට නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම. පිළිගත් ආයතනයක තනතුරට අදාළ ක්ෂේත්‍ර කටයුතු පිළිබඳ මාස හයකට නොඅඩු පාඨමාලාවකින් සමත්වීම විශේෂ සුදුසුකමක් වේ.
කළමනාකරණ සහකාර	අ) 105-11 වැ.ප අදාළ ස්ථිර තනතුරක වසර අටක් හෝ 105-10 වැ.ප අදාළ ස්ථිර තනතුරක වසර හයක සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම හෝ
	ආ) ගණිතය හා සිංහල භාෂාව ඇතුළුව විෂයන් හතරකට සම්මාන සහිතව අ.පො.ස. (සා.පෙ) විභාගයෙන් විෂයන් හයකින් සමත් වීම හෝ සමුපකාර (සා.පෙළ) සමත් වීම (ඉංග්‍රීසි භාෂාව සමත් වී තිබීම සහ පිළිගත් ආයතනයකින් ලබාගත් මාස හයකට නොඅඩු පරිගණක පාඨමාලාවක් සමත් වී තිබීම විශේෂ සුදුසුකමක් වේ)
පිළිගැනීමේ නිලධාරී	අ) 105-10 වැටුප් පරිමාණයේ වසර 05 ක් හෝ 105-11 වැටුප් පරිමාණයේ වසර 08 ක තනතුරට අදාළ ක් ක්ෂේත්‍රයේ සේවා පළපුරුද්දක් ලබා තිබීම. හෝ
	ආ) ගණිතය හා සිංහල භාෂාව ඇතුළුව විෂයන් සහිතව අ.පො.ස. (සා.පෙ) විභාගයෙන් විෂයන් හයකින් සමත්වීම හෝ සමුපකාර සා.පෙ. සමත් වීම හෝ සහ අදාළ ක්ෂේත්‍රයේ වසර 03 ක පළපුරුද්දක් ලබා තිබීම. ඉංග්‍රීසි / දෙමළ භාෂාව කථා කිරීමට හැකි වීම විශේෂ සුදුසුකමක් වනු ඇත.
ඖෂධ සංයෝජක	අ) අ.පො.ස. (උ.පෙ) විද්‍යා අංශයෙන් සමත් වීම සමග ඖෂධ සංයෝජනය පිළිබඳ පිළිගත් ආයතනයකින් සහතිකයක් ලබා තිබීම හෝ අ.පො.ස. (සා.පෙ) විභාගයෙන් විද්‍යා,ගණිතය, ඉංග්‍රීසි විෂයන් ඇතුළුව විෂයන් හයකින් සමත්වීම සහ ඖෂධ සංයෝජනය පිළිබඳ පිළිගත් ආයතනයකින් සහතිකයක් ලබා තිබීම සමග පිළිගත් වෛද්‍යවරයෙකු යටතේ වසරකට නොඅඩු සේවා පළපුරුද්දක් ලබා තිබීම.
කළමනාකරු ප්‍රාදේශීය	අ) 104-9 වැ.ප. අදාළ ක්ෂේත්‍රයේ ස්ථිර තනතුරක වසර 02 ක සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම හෝ 105-10 වැ.ප. අදාළ ක්ෂේත්‍රයේ ස්ථිර තනතුරක වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම හෝ
	ආ) අ.පො.ස. (සා.පෙ) ගණිතය සිංහල ඇතුළුව විෂයන් හයකින් සමත්වීම
වෙළඳ සහකාර	අ) අටවෙනි ශ්‍රේණිය සමත් වීම
රියදුරු	අ) අදාළ වලංගු රියදුරු බලපත්‍රය සමග 105-11 වැ.ප ස්ථිර රිය සහායක තනතුරක වසර 03 කට නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම. (බඳවා ගන්නා අවස්ථාවේ රිය පැදවීම පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණයකින් සමත් විය යුතුය) හෝ
	ආ) අටවෙනි ශ්‍රේණිය සමත්වීම සහ මෝටර් වාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද වසරකට වඩා පැරණි රියදුරු බලපත්‍රයක් තිබීම සහ වසරක සතුටුදායක සේවා පළපුරුද්දක් තිබීම.
රිය සහායක	අ) අටවන ශ්‍රේණියේ අධ්‍යාපන සහතිකය හා යොදවනු ලබන වාහනයට අදාළ රියදුරු බලපත්‍රයක් ලබා තිබීම විශේෂ සුදුසුකමක් වේ.
කම්කරු	අ) අටවන ශ්‍රේණිය සමත්වීම.
ඉන්ධන පුරවන්නා	අ) 8 වන ශ්‍රේණිය සමත් අධ්‍යාපන සහතිකය සමග පිළිගත් ආයතනයක ඉන්ධන පුරවන්නා තනතුරක මාස 06 කට නොඅඩු සේවා පළපුරුද්දක් ලබා තිබීම.

04. වයස් සීමාව - අභ්‍යන්තර සේවකයින් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

05. බඳවා ගැනීමේ ක්‍රමවේදය - ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

06. ඉල්ලුම්පත්‍රය පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිවැරදිව තොරතුරු සැපයිය යුතු අතර, බඳවා ගැනීමේදී නීති රීති අනුව යම් අයදුම්කරුවෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත් සම්මුඛ පරීක්ෂණය පැවැත්වීමට පෙර හෝ පැවැත්වීමේදී හෝ පසුව හෝ අයදුම්පත අවලංගු කළ හැකිය.

07. මෙම සමුපකාර සමිතියක සේවය කරන අයෙකු නම් අදාළ අයදුම්පත අදාළ සමිතිය මගින් ඉදිරිපත් කළයුතු අතර, ඇතැම් අයෙකු සමුපකාර සමිතියක සේවය කරන අතරතුර පෞද්ගලිකව අයදුම්පත එවා ඇතොත් ඔහු අදාළ තනතුර සඳහා තෝරාගත් පසුව වුව ද එය අනාවරණය වුවහොත් තනතුර අහිමි වීමට එය හේතුවක් වේ.

08. අයදුම්පත යොමු කිරීම.

- අයදුම්පත බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරයේ "මම අයදුම් කරනු ලබන තනතුර" පැහැදිලිව සඳහන් කළ යුතුවේ.
- සම්පූර්ණ කරන ලද අයදුම්පත 2023/04/14 දින හෝ එදිනට පෙර ලැබෙන සේ පහත දක්වෙන ලිපිනයට ලියාපදිංචි තැපැල් මගින් එවිය යුතුය. (අතින් ගෙනවිත් භාරදීමට ද හැකියාව ඇත) මෙදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත.

එම්. එම්. පී ඒ. ජේ. ජයවර්ධන ප්‍රනාන්දු
සභාපති,

සභාපතිතුමා
සී/ස මීගමුව විවිධ සේවා සමුපකාර සමිතිය,

Page 1 / 1 Zoom 100%